# මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වෙත ලැබුණු පැමිණිලි විභාග කරන්න

## පැෆරල් ජනපතිගෙන් ඉල්ලයි

**ඉන්දික හේවාවිතාරණ**

පසුගිය ජනාධිපතිවරණයේදී සියලුම නිරීක්ෂණ සංවිධාන, මැතිවරණ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මානව හිමිකම කොමිසම වෙත ලැබී තිබෙන පැමිණිලි විභාග කිරීම සඳහා විධිමත් බලය සහිත කමිටුවක් පත්කරන ලෙස පැෆරල් සංවිධානය ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගෙන් ඉල්ලා සිටියි.

එලෙස ලැබී තිබෙන පැමිණිලි විභාග කර සාමාන්‍ය ජනතාවට ශාරීරික හා මානසික පීඩා ඇතිවන ආකාරයෙන් කටයුතු කළ පුද්ගලයන්ට සහ රාජ්‍ය දේපළ, රාජ්‍ය නිලධාරීන් අවභාවිතයට ලක්කළ පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන ලෙසද එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

පසුගිය ජනාධිපතිවරණ සමයේදී සහ පශ්චාත් මැතිවරණ සමයේදී මැතිවරණ නීති උල්ලංඝනය කිරීම පිළිබඳව සහ රාජ්‍ය දේපළ, රාජ්‍ය නිලධාරීන්, මැතිවරණ කටයුතුවලට යොදාගැනීම පිළිබඳව නිරීක්ෂණ සංවිධානවලට, මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ පැමිණිලි ඒකකයට, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි විශාල ප්‍රමාණයක් ලැබී තිබෙන බවද ඔහු පවසා සිටියේය.

මෙලෙස ලැබුණු පැමිණිලි විභාග කර වැරදි කළ පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කර දඬුවම් ලබාදීමට හැකිවුවහොත් ඉදිරියේදී පැවැත්වෙන මැතිවරණවලදී නිදහස් හා සාධාරණ මැතිරණයක් පවත්වාගැනීමට ආදර්ශයක් සැපයිය හැකි බවද හෙතෙම සඳහන් කළේය.